Department of Social Statistics, University of Kelaniya
DOSS_2012/2013
SS/2012/0659

# ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය කුටුම්බ වියදම් කෙරෙහි ඇති කරන බලපෑම (කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොලහැල ග්‍රාම නිලධාරි වසම ඇසුරින්)

**යු. පී. පී. එස්. සමරනායක**

**සංක්ෂේපය**

ජනගහනය වයස්ගත වීමේ ක්‍රියාවලිය ජනගහන වර්ධනයේ අත්‍යන්ත ප්‍රතිඵලයකි. එනම්, ජනගහනය වයස්ගත වීම සාඵල්‍යතාවය පහළ යාම සහ පහළ මර්ත්‍යතා මට්ටම හේතුවෙන් ඇති වන ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියෙහි ප්‍රතිඵලයකි. වර්තමානය වන විට සංවර්ධනය වෙමින් පවතින රටවල්වල වයස්ගත ජනගහනය වර්ධනය ප්‍රබල සමාජ හා ආර්ථික ගැටලු රැසක් ජනිත කරනු ලබයි. මෙම අධ්‍යයනය සිදු කර ඇත්තේ, කුටුම්බ ආර්ථිකය මූලික කොටගෙන ය. ඒ අනුව, ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය කුටුම්බ වියදම් කෙරෙහි ඇති කරන බලපෑම කෙබඳු ද යන්න අධ්‍යයනය කිරීම  මෙම අධ්‍යයනයේ ගැටලුව බවට පත් විය. ඒ අනුව, කෑගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ගොලහැල ග්‍රාම නිලධාරි වසම ඇසුරින්, කුටුම්බ 78 කින් යුතු නියදියක් සරල සසම්භාවී නියැඳුම් ක්‍රමය භාවිතයෙන් ලබා ගන්නා ලදී. මෙහිදී ප්‍රාථමික දත්ත සහ ද්විතියික දත්ත යන දෙවර්ගයම භාවිතයට ගත් අතර ප්‍රාථමික දත්ත රැස් කිරීමට ව්‍යුහගත ප්‍රශ්නාවලියක්, නිරීක්ෂණ ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදී. ද්විතියික දත්ත මූලාශ්‍රයන් ලෙස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේනුවේ ප්‍රකාශිත වාර්තා, මහ බැංකු වාර්තා, සඟරා, පූර්ව පර්යේෂණ වාර්තා, සංඛ්‍යා සටහන් සහ ග්‍රන්ථ යනාදිය පරිශීලනය කරන ලදී. ලබා ගත් දත්ත SPSS සහ EXCEL යන මෘදුකාංග භාවිත කොට විශ්ලේෂණය කළ අතර විශ්ලේෂණය ක්‍රමයන් ලෙස විස්තරාත්මක සංඛ්‍යානය, ආර්ථිකමිතික ශිල්පීය ක්‍රම සහ ස්වායන්ත t පරීක්ෂාව භාවිතයට ගන්නා ලදී. මෙම අධ්‍යයනයෙන් ගම්‍ය වූ නිගමනයන් වූයේ,  කුටුම්බ වියදමට බලපාන කුටුම්බ සාමාන්‍ය මාසික ආදායම, මාසික ආහාර වියදම, මාසික අධ්‍යාපන වියදම, කුටුම්බය සතු වෙනත් වියදම්, වයස්ගත වූවන්ගේ මාසික සෞඛ්‍යය වියදම, වයස්ගත වූවන්ගේ මාසික සමාජ ක්‍රියාකාරකම් වියදම, වයස්ගත වූවන්ගේ මාසික ආගමික වියදම සහ වයස්ගත වූවන්ගේ මාසික වෙනත් වියදම් සහ මාසික කුටුම්බ වියදමට ධන සම්බන්ධතාවයක් දක්වන බව ය. වයස්ගත ජනගහනය සහිත සහ රහිත මුළු කුටුම්බ වියදම් අතර වෙනසක් පවතී ද යන්න විමර්ශනය සඳහා දත්ත විශ්ලේෂණය කළ අතර ඉන් ගම්‍ය වූ නිගමනය වූයේ, වයස්ගත පුද්ගලයන් සහිත කුටුම්බ සහ වයස්ගත පුද්ගලයන් රහිත කුටුම්බ වියදම්වල මධ්‍යයනයෙහි වෙනසක් නොමැති බවය. නමුත් මෙම කුටුම්බ දෙඅංශයෙහි සෞඛ්‍යය වියදම අතර වෙනසක් පවතින බව නිගමනය කළ හැකි විය.

**මුඛ්‍ය පදඃ *ජනගහනය, වයස්ගත වීම, කුටුම්බ, සාඵල්‍යතාවය, මර්ත්‍යතාවය***

---

prabodhasubha@gmail.com